# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
# ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය - 2020/2021
## දේශීය අභ්‍යන්තර සිසුන්

**අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා විස්තර/උපදෙස්**

ඉතා වැදගත්: මෙහි සඳහන් උපදෙස් හොඳින් කියවා බැලීමෙන් අනතුරුව තම අයදුම්පත සම්පූර්ණ කරන ලෙස **<u>සියලු ම අයදුම්කරුවන්ට මෙයින් තරයේ උපදෙස් දෙනු ලැබේ. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.</u>**

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමග)‍:

උදා ඃ- (පැවිදි අපේක්ෂකයෙකු නම්) රේවත, බී.

(ගිහි අපේක්ෂකයෙකු නම්) බණ්ඩාර, එම්.එම්.කේ.

මුලකුරුවලින් හැඳින්වෙන නම්:

(පැවිදි අපේක්ෂකයෙකු නම්) බිබිලේ

(ගිහි අපේක්ෂකයෙකු නම්) මොරමුලේ මුදියන්සේලාගේ කුමාර

සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්):

(පැවිදි අපේක්ෂකයෙකු නම්) BIBILE REVATHA

(ගිහි අපේක්ෂකයෙකු නම්) MORAMULE MUDIYANSELAGE KUMARA BANDARA

ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කරන්න.

2. ස්ථිර පදිංචි ස්ථානයේ ලිපිනය සඳහන් කරන්න.

ස්ථිර පදිංචි ස්ථානයේ ලිපිනය ඉංග්‍රීසි භාෂාවෙන් සඳහන් කරන්න.

ඔබ අයත් පරිපාලන දිස්ත්‍රික්කය සඳහන් කරන්න.

දුරකථන අංකය සඳහන් කරන්න.

ඉහත ලිපිනයෙහි පදිංචි කාලය සඳහන් කරන්න.

3. 2018 අ.පො.ස (උ.පෙළ) හෝ 2019 අ.පො.ස (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල හා විෂයන් නිවැරදි ව පිළිවෙළින් සඳහන් කරන්න.

2018 අ.පො.ස (උ.පෙළ) හෝ 2019 අ.පො.ස (උ.පෙළ) විභාගයට පෙනී සිටි පරිපාලන දිස්ත්‍රික්කය සඳහන් කරන්න.

| පරිපාලන දිස්ත්‍රික්කය | අංකය |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මාතලේ | 04 |
| මහනුවර | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |

| පරිපාලන දිස්ත්‍රික්කය | අංකය |
|---|---|
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| කිලිනොච්චි | 11 |
| මන්නාරම | 12 |
| මුලතිව් | 13 |
| වව්නියාව | 14 |
| ත්‍රිකුණාමලය | 15 |
| මඩකලපුව | 16 |

| පරිපාලන දිස්ත්‍රික්කය | අංකය |
|---|---|
| අම්පාර | 17 |
| පුත්තලම | 18 |
| කුරුණෑගල | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| කෑගල්ල | 24 |
| රත්නපුර | 25 |

4. පාලි භාෂා විෂයට අදාළ සුදුසුකම් සඳහන් කරන්න.

5. ප්‍රාචීන මධ්‍යම විභාගයට පෙනී සිටියේ නම් එම ප්‍රතිඵල සඳහන් කරන්න.

6. උපන් දිනය, ස්ථානය සහ **2020.06.30 දිනට** වයස සඳහන් කරන්න.

   ස්ත්‍රී/පුරුෂ භාවය සහ විවාහක/අවිවාහක භාවය සඳහන් කරන්න.

   ජාතිය සහ ආගම සඳහන් කරන්න.

7. ගුරු හිමියන්ගේ හෝ භාරකරුගේ නම සහ ලිපිනය සඳහන් කරන්න.

8. රැකියාවක් ඇත් නම් සඳහන් කරන්න. සේවා යෝජකයාගේ නම සහ ලිපිනය සඳහන් කරන්න. රැකියාවක් නොමැති නම් ''නැත'' යනුවෙන් සඳහන් කරන්න.

9. 2018 හෝ 2019 වසරට පෙර අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිට ඇත් නම් විමසා තිබෙන සියලු ම තොරතුරු සඳහන් කරන්න. 2018 හෝ 2019 වසරට පෙර අ.පො.ස (උ.පෙළ) විභාගයට පෙනී සිට නැත්නම් ''අදාළ නොවේ'' යනුවෙන් සඳහන් කරන්න.

10. වෙනත් විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක ලියාපදිංචි වී ඇත්නම් ''ඔව්'' යනුවෙන් සඳහන් කොටුවේ ✓ලකුණ යොදා විමසා ඇති සියලු ම තොරතුරු සඳහන් කරන්න. එසේ නැති නම් ''නැත'' යන කොටුවේ X යොදන්න.

11. ඔබ ප්‍රථම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා ශිෂ්‍යත්වයක් ලබා ඇත් නම් ''ඔව්'' යනුවෙන් සඳහන් කොටුවේ ✓ලකුණ යොදා විමසා ඇති සියලු ම තොරතුරු සඳහන් කරන්න. එසේ නැති නම් ''නැත'' යන කොටුවේ X යොදන්න.

12. ඔබ අ.පො.ස (උ.පෙළ) විභාගයට පෙනී සිටියේ පාසල්/පිරිවෙන්/පෞද්ගලික අපේක්ෂකයකු ලෙස නම් ඊට අදාළ කොටුව ඉදිරියේ ✓ ලකුණ යොදන්න.

13. පාසල්/පිරිවෙන් අපේක්ෂකයින් අ.පො.ස (උ.පෙළ) විභාගයට පෙනී සිටි පාසල/පිරිවෙන පිළිබඳ විස්තරය සපයන්න.

14. පාසල්/පිරිවෙන් අපේක්ෂකයින් වර්ෂ 5කට පෙර ඇතුළත් වූ පාසල්/පිරිවෙන් සඳහන් කරන්න.

15. පෞද්ගලික අපේක්ෂකයින් අධ්‍යාපනය ලැබූ සියලු ම පාසල් හෝ පිරිවෙන් පිළිබඳ විස්තරයක් සඳහන් කළ යුතුය.

16. විශ්වවිද්‍යාලය ප්‍රවේශය සඳහා ඔබ තෝරා ගන්නා භාෂා මාධ්‍යය
(සිංහලෙන් ද/ඉංග්‍රීසියෙන් ද යන්න)

16.1 විෂයන් අනුපිළිවෙලින් සඳහන් කළ යුතු ය.
**ඔබ විශ්වවිද්‍යාලයට තෝරා ගනු ලැබුවහොත් ලියාපදිංචි වී සති දෙකකින් පසු ව ප්‍රවේශය සඳහා තෝරා ගත් විෂයයන් වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.**

- ❖ පාලි විෂය අනිවාර්ය විෂය වේ. අංක 2 සඳහා බෞද්ධ දර්ශනය හෝ බෞද්ධ සංස්කෘතිය තෝරා ගත යුතු ය. අංක 3, 4. 5 සඳහා සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශන, පුරාවිද්‍යාව, බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය, ප්‍රජා නායකත්වය, සිංහල, සංස්කෘත, ඉංග්‍රීසි, ප්‍රංශ, හිංදි, කොරියන්, ජපන්, දෙමළ, චීන යන විෂයන් ගෙන් 3ක් තෝරා ගත යුතු ය.
- ❖ පළමු වසරේ දී සිංහල මාධ්‍යයෙන් පාඨමාලාව හදාරන සිසුන් අනිවාර්ය ඉංග්‍රීසි (Compulsory English) සහ බෞද්ධ උපදේශනය ද, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හදාරන සිසුන් මූලික ඉංග්‍රීසි පාඨමාලාව (Preliminary Course in English) සහ බෞද්ධ උපදේශනය ද අනිවාර්ය වේ. උපාධි සහතිකය ලැබීමට මෙම විෂයන් දෙක ම සමත් විය යුතු ය.
- ❖ ප්‍රථම වර්ෂය සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් දේශන පැවැත්වෙන්නේ පාලි, බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශන, පුරාවිද්‍යාව, සංස්කෘත,

බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය, ප්‍රජා නායකත්වය, බෞද්ධ උපදේශනය යන විෂයන් සඳහා පමණි.

17. අයදුම්කරුවන් විසින් නේවාසිකාගාර පහසුකම් අවශ්‍ය හා අනවශ්‍ය බව අදාළ තීරුවේ සටහන් කළ යුතුය.

18. අයදුම්කරුවන්ගේ ප්‍රකාශය හොඳින් කියවා බලා අවබෝධ කොට ගෙන අත්සන සමග දිනය යෙදිය යුතු ය. **අත්සන සමග දිනය හෝ අත්සන හෝ දිනය හෝ නොමැති ව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව සියලු ම අපේක්ෂකයින් දත යුතු ය.** එම නිසා අයදුම්පත තැපැල් කිරීමට පෙර හෝ භාර දීමට පෙර තම අත්සන සමග දිනය යොදා තිබේ ද යන්න නැවත පරීක්ෂා කර බලන ලෙස සියලු ම අපේක්ෂකයන්ට මෙයින් උපදෙස් දෙනු ලැබේ.

19. අ.පො.ස. (උ.පෙළ) විභාගයට පාසලින් පෙනී සිටි අපේක්ෂකයින් තම අයදුම්පත විදුහල්පතිවරයා ලවා ද පිරිවෙන්වලින් පෙනී සිටි අපේක්ෂකයින් තම අයදුම්පත පරිවේණාධිපතීන් වහන්සේ ලවා ද සහතික කරවා ඉදිරිපත් කළ යුතු ය.

20. පෞද්ගලික අයදුම්කරුවන් තම අත්සන අංක 30හි සඳහන් අයෙකු ලවා සහතික කොට එවිය යුතු ය.

21. අයදුම්පතෙහි අංක 1 සිට 20 දක්වා සඳහන් තොරතුරු සම්පූර්ණ කර එවනු නොලබන අපේක්ෂකයින්ගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලබන බැවින් තම අයදුම්පත් නිවැරදි ව සම්පූර්ණ කර තිබේ ද යන්න අයදුම්පත තැපැල් කිරීමට හෝ භාර දීමට පෙර නැවත පරීක්ෂා කර බලා තහවුරු කර ගන්නා ලෙස සියලු ම අපේක්ෂකයින්ට තරයේ උපදෙස් දෙනු ලැබේ.

22. නියමිත දිනට පසු ව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බැවින් තම අයදුම්පත් **2020/06/30** දින හෝ එදිනට පෙර ලැබෙන සේ එවන ලෙස සියලු ම අයදුම්කරුවන්ට මෙයින් දැනුම් දෙනු ලැබේ.

23. අවශ්‍ය පැවිදි/ගිහි ශිෂ්‍යයන්ට නේවාසිකාගාර පහසුකම් සපයනු ලැබේ. ඒ පිළිබඳ ව වැඩි විස්තර සහකාර ලේඛකාධිකාරී (මහෝපාධ්‍යාය සම්බන්ධීකරණ හා ශිෂ්‍ය සේවා) මගින් විමසා දැන ගත හැකි ය. නේවාසික සිසුන් නේවාසිකාගාර නීති රීති පිළිපැදිය යුතු ය.

24. තෝරා ගනු ලබන සුදුසුකම් සපුරාලන පැවිදි/ගිහි පිරිමි ශිෂ්‍යයන්හට මහපොළ හෝ ශිෂ්‍යාධාර ලබා දෙනු ඇත. මහපොළ / ශිෂ්‍යාධාර පිළිබඳ වැඩි විස්තර සහකාර ලේඛකාධිකාරී (මහෝපාධ්‍යාය සම්බන්ධීකරණ හා ශිෂ්‍ය සේවා) මගින් විමසා දැන ගත හැකි ය. මහපොළ/ශිෂ්‍යාධාර ලබා ගැනීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් නියමිත සුදුසුකම් සපුරාලිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් පනවා තිබෙන නීතිරීතිවලට යටත් විය යුතු ය.

25. ශිෂ්‍යයන් ලියාපදිංචි කිරීමට අදාළ තොරතුරු සහකාර ලේඛකාධිකාරී (මහෝපාධ්‍යාය සම්බන්ධීකරණ හා ශිෂ්‍ය සේවා) මගින් විමසා ලබා ගත හැකි ය.

26. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වීම සඳහා අයදුම් කරනු ලබන අපේක්ෂකයින් අයදුම්පත් එවනු ලබන අවස්ථාව වන විට වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක (විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාලයක/ ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ/ අධ්‍යාපන විද්‍යා පීඨයක ආදී) ලියාපදිංචි වී සිටින බව අනාවරණය වුවහොත් ඔහුගේ ශිෂ්‍ය ලියාපදිංචිය අවලංගු කරනු ලබන බව ද, ඒ සමග ඊට අදාළ සියලු වරප්‍රසාද අහිමි වන බව ද සියලු ම අයදුම්කරුවන් දත යුතු ය.

27. **2020/2021** විශ්වවිද්‍යාලය ප්‍රවේශය සඳහා අපේක්ෂකයන් තෝරා ගනු ලබන්නේ 2018 හෝ 2019 පැවති අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව ය. සිසුහු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන්

සභාවේ බඳවා ගැනීමේ නිර්ණායක අනුගමනය කරමින් සම්මුඛ පරීක්ෂණයකට ලක්කොට බඳවා ගැනෙති.

28. අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර **2020/06/30** දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

***අයදුම්පත එවිය යුතු ලිපිනය***

සහකාර ලේඛකාධිකාරී (මහෝපාධ්‍යාය සමබන්ධීකරණ හා ශිෂ්‍ය සේවා),
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
ගුරුළුගෝමී මාවත, පිටිපන උතුර,
හෝමාගම.

29. අපේක්ෂකයින් ලියාපදිංචි කර ගනු ලබන්නේ ඔවුන්ගේ අධ්‍යාපන සහතිකපත් පරීක්ෂා කිරීමෙන් පසු ව බැවින් අයදුම්පතෙහි සඳහන් සහතික පත්වල මුල් පිටපත් ඉදිරිපත් කරන ලෙස අපේක්ෂකයින්ට දන්වා යැවූ විට එම සහතික විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීම අනිවාර්ය බව සලකන්න. ඉන් පසු ව ලියාපදිංචි ගාස්තු ගෙවීම් පිළිබඳ ව දන්වා එවනු ලැබේ.

30. අයදුම්පත සමග කිසිදු මුදල් ගෙවීමක් නොකළ යුතු ය. එහෙත් **අධ්‍යාපන සහතිකවල සහතික කළ ඡායාපිටපත් අනිවාර්යයෙන්** අයදුම්පත සමග අමුණා එවිය යුතු ය.

31. ***අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම.***

සෑම පෞද්ගලික අයදුම්කරුවෙකු ම පහත සඳහන් කවරෙකු හෝ ලවා තම අත්සන සහතික කරවා ගත යුතු ය.

පරිවේණාධිපතීන් වහන්සේ නමක්, විහාරාධිපතීන් වහන්සේ නමක්, ආගමික ස්ථානයක් භාර පූජකවරයෙක්, විදුහල්පතිවරයෙක්, ග්‍රාමසේවා නිලධාරිවරයෙක්, සාමදාන විනිශ්චයකාරවරයෙක් හෝ වසරකට රු. 86,700/- කට නොඅඩු වැටුපක් ලබන රජයේ, පළාත් පාලන හෝ රාජ්‍ය සංස්ථා සේවාවක මාණ්ඩලික නිලධාරියෙක්.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
පිටිපන උතුර
හෝමාගම.
2020/05/12